


# තවත් එක හපන්කමක්

නිලක්ෂි යසස්මි

# තවත් එක හපන්කමක්

නිලක්ෂි යසස්මී

05/02/2025

CONFIDENTIAL

*ISBN – 978-624-208-750-4*

# පූදම

තමමම පොත් පිංච සකස් කිරීමට
සහය දැක්වූ හා උදවූ උපකාර
කල සියලු ම දෙනාට මෙම පොත
පූදම.

CONFIDENTIAL

## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතිත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.
මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දිමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

නමින් පොල්ගස්හේන යන පිටිසර ගම කලුතරට යාබදව පිහිටා ඇත. වනාන්තරයට යාබදව පිහිටා ඇති මෙම ගම්මානය ඉතා ඉහළ ස්භාව සෞන්දර්යකට හිමිකම් කියයි.  අශේන් යනු වයසින් අවුරුදු දොළහක් වන පිරිමි ළමයෙකි. හත වසරේ ඉගෙනුම ලැබුවත් පාසල් අවසන් වී තම වයසේ මෙන්ම ඔහුට බාල වයසේ කොලුගැටයන් සමග රෑබෝ වන තුරු සෙල්ලම් කිරීම මොවුන්ගේ සිරිත වේ. මොවුන්ගේ කුඩා පාසල් කාලය ලඳු කෑලෑ , වනාන්තර , දිය ඇළි, ආදිය සමග ගෙවී ගියේ ය. අශේන් මේ කල්ලියේ නායකයා විය.  අශේන්ගේ හොදම මිතුරන් වූයේ කල්පනී , අමිල , කසුන් , ගයානි ය. වැඩිහිටියන් නුරුස්සන වැඩ සිදු කරන මොවුන්ව ගමේ සියලුම දෙනා හොදින්

CONFIDENTIAL

හඳුනති. නමුත් ගමේ බොහෝ දෙනා මොවුන්ට ආදරයෙක් දක්වති. සුලු දෙයක් වුවද එය වීර කමක් ලෙස සලකන මොවුන් සැහැල්ලු කුරුල්ලන් මෙන් සතුටින් සිටියහ.

* * * *

මූකලානේ පිහිටි විශාල කළුවර ගස මොවුන්ගේ මූලස්තානය විය. එම ගසේ මුදුනට නැග්ග විට මුලු ගමම පැහැදිලිව පෙනේ. දිනක් සියලු ම දෙනා පාසල් අවසන් වී මොවුන්ගේ මූලස්තානයට පැමිණියහ නමුත් කුමක්හෝ අඩුවක් තිබේ ‘ කෝ කල්පනී ’ ඒ දෙසට දුවගෙන එන කසුන්ගෙන් අශේන් ඇසුවේ ය. ‘ අනේ මන්ද එයා අද ඉස්කෝලේ ආවෙත් නෑ ’ කසුන් පැවසුවේ

ය. 'මට ගයානි කිවීවා, එයාට බෝවෙන ලෙඩක් හැදිලලු තියෙන්නෙ' කසුන් පැවසුවේ ය. පසුව ගයානිවත් කල්පනීවත් නොමැති නිසා මොවුන් ගස පාමුල වාඩිවුනේ ය. 'ගිරවීයෝ වගේ කියවන මුන් දෙන්නා නැතුව මටත් පාලුයි බන් ' කසුන් පැවසුවේ ය. 'අපි යන්ද කල්පනී බලන්න' ඒ අශේන්ගේ අදහසයි. ' පිස්සු ද බන් ඒ ලෙඩේ අපිටත් බෝ වුනෙත් ආ.... හැබැයි ගයානි කිව්වා, ඒ ලෙඩේ කොල්ලොන්ට බෝ වෙන්නේ නෑ කියලා.' 'ඒකට කමක් නෑ මට අද කලින් නිදා ගන්න ඕනේ. හෙට සෙනසුරාදනේ අපි උදේන් ම ඇවිත් සෙල්ලම් කරමු. දැන් යමු ගෙදර ' අශේන් පැවසුවේ ය.

* * * *

පසු දින උදෑසන ආශේන්ට මහා ඝෝසාවක් ඇසුනි. ඔහු ඇදෙන් නැගිට සාලෙට එනවිට කුමක් හෝ පාර්සලයක් කනප්පුව උඩ තිබිණි. ‘ අම්මේ කවුද ආවේ. මොකද්ද මේ පාර්සලය ’ අශේන් ඇසුවේ ය. ‘ ආ.... පුතේ කල්පනීලගෙ මගුල් ගෙදරින් ’ අම්මා පැවසුවේ ය.’ මොකා! ඒ කියන්නේ කල්පනී බැදල ද? ’ කසුන් කලබලයෙන් ඇසුවේ ය. ‘පිස්සු ද ලමයෝ....ඒ කෙල්ල කොටහලු වෙලා අම්මා සිනාසෙමින් පැවසීය . ‘ ඒ මොන ලෙඩක් ද ඒ....’ පුදුමයෙන් අශේ ඇසී ය. ‘ ආහා තව අවුරුද්දකින් විතර ඔයත් ඕව දැනගනී.’ ‘අනේ මන්ද ගිය අවුවැස්සෙ ගයානිටත් ඔය වගේම ලෙඩක් හැදුනා. ඒත් එහෙ උත්සවයක් තිබුණා. මෙදාපාර එහෙම නැද්ද? ’‘මොකෝ නැත්තෙ පස්සෙ තියෙයි.’ ‘අනේ මන්ද ඔය කැවුම් දැන්නම් මට කන්න බෑග හැබැයි මගෙ පංගුව ඉතිරි කරල

CONFIDENTIAL

තියන්න හොදේ. මම යනවා සෙල්ලම් කරන්නග අදවත් කල්පනී ආවොත් හොදයි. අශේන් දිවගියේ ය.

* * * *

පාසල් වාරයේ පළමු නිවාඩුව එනම් ගස් වල මල් පිපෙන ල රසම රස පලතුරු ඉදෙන ල කොච්චර ඇහුවත් එපා වෙන්නෙ නැති ඒ ලස්සන කොහාගේ හඬත් සමග මේ ආරම්භ වන්නේ ලස්සන ම ලස්සන බක් මාසයයිග විශේෂයෙන් ම කසුන් ඇතුළු කසුන්ගේ කල්ලිය නම් මේ නිවාඩුව ලැබෙන තෙක් ඇඟිලි ගනිමිනුයි සිටියේ. තමන්ට ඇති තරම් නිදහස් කුරුල්ලන් සේ සෙල්ලම් කිරීමට හැකියාව ලැබෙන නිසා.

CONFIDENTIAL

මේ කල්ලිය දඟකාරකම් මෙන්ම හපන්කම් ද නොකරනවා ම නොවේ. මේ කල්ලිය දැන් එන්න එන්න ම කතා බහට ලක් වෙනවා. මේකට හේතුව නම් බක් මාසයේ පැවැත් වූ උත්සවයක දී පාලිත නම් වූ මදාවි මිනිසා මුදල් පසුම්බියක් සොරකම් කිරීමට යනවා දැක මේ කල්ලිය ඔහුට පහර දී මුදල් පසුම්බිය නැවත එම නැන්දාට ලබා දීමට කටයුතු කලේ ය.

බක් මාසයේ පැවැතවෙන සියලු ම අවුරුදු උත්සව වලට සහභාගී වීම මේ කාලයේ මොවුන්ගේ පලමු රාජකාරියයිග උවුරුද්ද ඉවර වෙන තුරු මේ ගම හරිම නොසන්සුන්ග දිනක් අශේන් ඔවුන්ගේ මූලස්ථානයට පැමිණියේ ය. ‘ කෝ ඉතින් මූලස්ථනයේ මූලිකයා නෑනේ ’ මේ කසුනයා කොහේ ගියාද මන්දා? තමවුන්ගේ

CONFIDENTIAL

මූලස්ථානය වන විශාල කළුවර ගස අසල සිට අශේන් පැවසුවේ ය.

මතු සම්බන්ධයි....

CONFIDENTIAL

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්